# සාහිත්‍ය සන්නිවේදනය මානව සබඳතා සඳහා ඉටුකළ භූමිකාව



**ආචාර්ය ටියුඩර් වීරසිංහ**

සාහිත්‍ය සන්නිවේදනය යනු මානවයා බාහිර සමාජය සමග සම්බන්ධතාව හැඩගස්වා ගනු ලබන මාධ්‍යයක් පමණක් තාව යථාර්ථය නිර්මාණය කිරීමේ සහ එය නිර්මාණය කිරීමේ ද ක්‍රිය මාධ්‍යයකි. මානව ලෝකය නිර්මාණය වන්නේ සහ සංවර්ධනය න්නේ වේදකා වෛෂයික සම්බන්ධතාව තුළ ය. එයට විවිධ වූ වරූප අයත් වන අතර, සමහර ස්වරූප පාර ස්වරූපීය ස්වභාවයක් න්නේ ය. සන්නිවේදනය ඒ අතර ප්‍රබල පාරස්වරූපයක් ලෙස ැඳින්විය හැකි ය. සමාජ විඥානයේ ඕනෑම ස්වරූපයක් (විද්‍යාව, ර්ශනය, ආගම, කලාව, දේශපාලනය සදාචාරය, සෞන්දර්යය, ාහිත්‍ය ආදී) පවතින්නන් සහ සංවර්ධනය වන්නේ පුළුල් වූ ද ැඹුරු වූ ද, සංකීර්ණ වූ ද සන්නිවේදන ක්‍රියාවලියක් තුළ ය. ඉන් රිබාහිරව ඒ කිසිම ස්වරූපයකට අර්ථයක් හෝ පැවැත්මක් ද නාමැත. සන්නිවේදනය මේ සියලුම ස්වරූපය අතර තිරස් හා සිරස්

සබඳතා ද අභ්‍යන්තර සහ බාහිර සබඳතා ද ගොඩනැගීමේ සහ ඒවා පවත්වාගෙන යාමේ ඒකායන මාධ්‍ය බව ප්‍රකට ය. සාහිත්‍ය ද සමාජ විඥානයේ ස්වරූපයක් වශයෙන් එහි පැවැත්මට සහ සංවර්ධනයට සන්නිවේදනය අත්‍යවශ්‍ය වූවකි. එය සාහිත්‍ය සන්නිවේදනය ලෙස හැඳින්විය හැකි ය. සාහිත්‍ය සහ සන්නිවේදනය අතර ප්‍රශ්නය මතු වන්නේ ප්‍රථමයෙන්ම එය සමාජ විඥානයේ ස්වරූපයක් වශයෙන් එයට පැවැත්ම සඳහා එහි ඇති සමාජ අවශ්‍යතාවක් දෙවනුව එය සමාජ ආධ්‍යාත්මික අසහනයක් වශයෙන් වර්ධනය වීමට ඊට ආභ්‍යන්තරික වශයෙන් ඇති වැදගත්කමයි. ඒ අනුව සාහිත්‍ය පතනයක් යනු එය එක් අතකින් නිර්මාණයක් මෙන්ම අනෙක් අතින් සන්නිවේදන මාධ්‍යයකි.

සමකාලීන සාහිත්‍ය මෙන්ම වාග්විද්‍යාව ද මූලික වශයෙන් සහ සමස්තයක් වශයෙන් මානව කේන්ද්‍රීය ප්‍රවණතාවක් ඔස්සේ වර්ධනය වන අතර වටිනාකම්, පුරුෂාර්ථ මිනිසා, කේන්ද්‍ර කරගෙන හැඩගැසෙන බව පෙනේ. මේ නිසා මේ යුගයේ දී සම් දෙයක් ඒ දේ සඳහාම ඇති වැදගත්කමට වඩා ඒ සන්නිවේදනය තුළ නිරූපණය වන ආකාරය ඉතා වැදගත් වේ. පුද්ගලයෙක් වෙනත් පුද්ගලයෙක් සඳහා පඨයක් නිර්මාණය කරන අතර විවිධාකාර පඨ ඔස්සේ මිනිසුන් එකිනෙකා සබඳතා නිර්මාණය කර ගනිති. "මානව බුද්ධිය සන්නිවේදනය මගින් බිහි වන බව; දාර්ශනිකයෙක් වන පෙඩ්‍රොවින්ස්කි ප්‍රකාශ කළේ ය. එයට ප්‍රධාන හේතුව වන්නේ මානව බුද්ධිය සාමූහික ස්වභාවයක් දරන්නේ ය. මිනිසා වෙනත් මිනිසුන් සමග සන්නිවේදනයෙහි නියැලෙමින් ලෝකය පිළිබඳ දැනුම මෙන්ම තමා පිළිබඳ දැනුම ද ලබා ගන්නේ ය. ඒ සඳහා ඔහුට මුලින්ම වාචික සන්නිවේදනය ද පසුව ලිඛිත සන්නිවේදනය ද අවශ්‍ය වේ. මානව පුද්ගලයින් ළමා කාලයෙහි සම්පප්‍රලාපයේ සිට විධිමත් පත දක්වා ගමන් කරයි. වර්තමාන ලෝකයේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යයන්ගේ ව්‍යාප්තිය නිසා මිනිසුන් මිනිසුන් අතර සිදුවන තොරතුරු හුවමාරුව වර්ධනය වී ඇත. මේ සකල විධ සන්නිවේදන මාධ්‍යයන්ගේ සහ සංහතික මාධ්‍යයන්ගේ ප්‍රසාරණය සහ වර්ධනය අභිබවා සාහිත්‍ය සන්නිවේදනය පෙරට පැමිණ තිබේ.



මානව සමාජයේ ලිඛිත ඉතිහාසය ආරම්භ වන්නේ සමාජ සංවර්ධනයේ නිශ්චිත මට්ටමකදී ය. එය සමාජ සංවිධාන රටාව සාපේක්ෂ වශයෙන් සංකීර්ණ වීමත් සමාජ පන්තිවලට බෙදීමත් සමග සම්බන්ධ වේ. සමස්ත මානව සංහතියේ ජීවිතයෙන් 80% ක්ම අයත් වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයට වන බව මානව විද්‍යාඥයින්ගේ පොදු පිළිගැනීමයි. එම විශාල කාල පරාසය මානව සංහතියේ ම්ලේච්ඡ හා අශිෂ්ට අවධි වශයෙන් සැලකෙන අතර, එම අවධිවල දී මානවයාට ලිඛිත ඉතිහාසයක් නොවීය. එය මානව සංහතියේ ප්‍රාග් ලිඛිත ඉතිහාසය ලෙස හැඳින්විය හැකි ය. මානව සමාජය ලිඛිත යුගයට ප්‍රවිෂ්ට වීමත් සමගම මානව ශිෂ්ටාචාරය ආරම්භ වූ බව ඓතිහාසික තොරතුරුවලට අනුව අනාවරණය වේ.

මානව තොරතුරු ක්‍රියාවලියේ හරයාත්මක ස්වරූපය බිහි වන්නේ සමාජ සංවර්ධනයේ නිශ්චිත මට්ටමක දී ය. මේ අනුව පූර්ව පංති සමාජය පූර්ව ලිඛිත ඉතිහාසයට සමපාත වන්නාසේම පංති සමාජ අවධිය ලිඛිත ඉතිහාස අවධියට සමපාත වන්නේය.

මානව සංහතියේ විවිධ වූ සන්නිවේදන ස්වරූපවලට සමගාමීව ප්‍රාග් සාහිත්‍ය ස්වරූප වර්ධනය වූ බව පෙනේ. ප්‍රාථමික අවධිවල සිටම සාහිත්‍ය මානව සන්නිවේදන ස්වරූපයක් පමණක් නොව මිනිස් විඥය නිර්මිතකරණයේ ප්‍රබල සංරචකයක් ලෙස ද ක්‍රියා කළේ ය. මානව විඥයේ මූල ස්වරූපයක් ලෙස සාහිත්‍ය සන්නිවේදනය ක්‍රියාත්මක වන්නේ ය. සාහිත්‍ය මානව විඥානයේ සුවිශේෂ ස්වරූපයක් වශයෙන් එය මානව ද්‍රව්‍ය හැඩගැස්වීමෙහිලා අති විශාල කාර්යභාරයක් ඉටු කර තිබේ.

පොදු ජන තොරතුරු ක්‍රියාවලිය සිය ස්වභාවය අනුව සමාජීය සන්නිවේදනාත්මක මෙන්ම සම්භාෂණාත්මකය. සන්නිවේදන ස්වරූපය යනු සමාජ යථාර්ථය පරාවර්තනය කිරීමේ මාදිලියය. ප්‍රාථමික සමාජයේ ජීවත් වූ මිනිසුන්ගේ සමාජීය ක්‍රියාවලිය සනිටුහන් කරන ලද්දේ විවිධ වූ ප්‍රාථමික සන්නිවේදන ස්වරූපය තුළ ය. මෙම සමාජයේ මිනිසුන්ගේ ජීවිතය සංවිධානගත වී තිබුණේ සාමූහිකව වන අතර, ඔවුන්ගේ ක්‍රියාකාරකම් බහුකාර්ය, බහුකෘත්‍ය ස්වභාවයක් ඉසිලී ය. මෙම ප්‍රාථමික සමාජයේ නිර්මාණ සාමූහික ස්වරූපයක් ගත්තේ ය. එසේ ම පොදුජන සන්නිවේදන ස්වරූප ද සාමූහික ස්වභාවයක්

අත්පත් කර ගත්තේය. සන්නිවේදන ස්වරූපය දැන හඳුනා ගැනීම හා ඒවා අවබෝධ කර ගැනීම අවශ්‍ය වන්නේ සන්නිවේදනය පිළිබඳ පුළුල් හා ගැඹුරු වැටහීමක් ලබාගැනීමට පමණක් නොව පොදුවේ මානව සංහතියේ ඓතිහාසික පරිණාමය පිළිබඳ පුළුල් පර්යාවලෝකනයක් ඇතිකර ගැනීමට ද එය අවශ්‍ය වන්නේ ය.

ප්‍රාථමික සමාජයෙහි වූ සන්නිවේදන ස්වරූපවල සහ සාහිත්‍යමය භාවිතයේ විශේෂම ලක්ෂණය වශයෙන් සැලකිය හැක්කේ වාචික සහ සජීවී ගතියයි. මිලේච්ඡ අවධියේ දී මානවයා ලද ප්‍රධානතම ජයග්‍රහණය වූයේ භාෂණ හැකියාව ලබාගැනීම බව එංගල්ස්ගේ අදහසයි. මානව සංහතියේ එම ජයග්‍රහණයත් සමග සන්නිවේදන ස්වරූපයන්ගේ වර්ධනය සම්බන්ධ වන්නේය. පොදුජන සන්නිවේදන සම්භාෂණය තුළ වාචික ඉදිරිපත් කිරීමේ ස්වරූපය මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

මානව සංහතියේ ප්‍රථම පොදුජන සන්නිවේදන ස්වරූපය වශයෙන් ඕනෑම වියමනක් (පඨයක්, පෙළක්) දැක්විය හැකිය. එය වාචික ඉදිරිපත් කිරීමක් ද විය හැකි ය. මේ සියලුම නිගමනයන් මූලාකෘත සන්නිවේදන ස්වරූපය ලෙස සැලකිය හැකි ය. එය බාහිර පුද්ගලයෙකු සමග කෙරෙන සන්නිවේදනයක් පමණක් නොව අන්තර්වර්තීව කෙරෙන සම්භාෂණයක් ද විය හැකි ය. මානව ඉතිහාසයේ මුල්ම සන්නිවේදන ස්වරූපවල කර්තෘන් වශයෙන් ඉදිරිපත් වූයේ ගෝත්‍ර ව්‍යුහයන් ය. මෙම සන්නිවේදන ස්වරූපය තුළ විවිධ සභා නිර්මාණය වන්නට විය. 'සාකච්ඡා සභා', 'විමසීම් සභා', 'විනිශ්චය සභා', 'උපදේශ සභා' නිදර්ශන ලෙස දැක්විය හැකි ය. ඉහත දක්වන ලද මූලික සන්නිවේදන ස්වරූප ආශ්‍රිතව අණබෙරකාරයා, වේදිකාව, ගුරුවරයා හා කතන්දරකාරයා ආදී සම්භවය අනුව විවිධ පොදුජන සන්නිවේදන ස්වරූප බිහිවිය. මෙම සන්නිවේදන ස්වරූප පොදු අපෞද්ගලික සන්දර්භයකින් සමන්විත විය. වෘත්තීය තුළ පෞද්ගලිකත්වය තහවුරු නොවිය. 'සභාව' පවත්වන කාලයේ තුළ දී ගෝත්‍රයේ ඕනෑම සාමාජිකයකුට එහි අණබෙරකරු විනිශ්චයකරු ගුරු කතන්දරකරු බවට පත් විය හැකි ය. තම ගෝත්‍රය අභ්‍යන්තරයේ යුතුකම් හා අයිතිවාසිකම් වශයෙන් වෙනසක් නොවී ය. පොදුජන සන්නිවේදන ස්වරූපවල



නිර්මාපකයෙක් විය. මේ ප්‍රාථමික සමාජවල සමස්ත සන්නිවේදන ක්‍රියාවලියට බහුකාර්ය, බහුකෘත්‍ය ස්වභාවයක් ගත් අතර, එහි මූලිකම ලක්ෂණය ලෙස දැක්විය හැක්කේ සාමූහික නිර්මාණාත්මක බවයි. ප්‍රාථමික සමාජයේ සියලුම සමාජිකයින් විවිධ උත්සවවල දී චාරිත්‍රවල දී පිළිවෙත් තුළ දී පුරාවෘත්තවලදී එකවරම සහභාගිවන්නන් බවට ද ප්‍රේක්ෂකයන් බව ද පත් විය. සන්නිවේදන ක්‍රියාවලියද විවිධ උපාංගවලට බෙදී නොතිබිණ. එනම් සන්නිවේදකයා හා ග්‍රාහකයා ආදී වශයෙන් වෙන වෙනම හඳුනාගැනීමට නොහැකි වූ අතර, එය ඒකීය බහුකාර්ය බහුකෘත්‍ය සමස්තයක් ලෙස ක්‍රියාත්මක විය. මෙම කොන්දේසි තුළ වර්ධනය වූ සාහිත්‍ය සහ සංස්කෘතික විඥානය ද පොදු සාමූහික ස්වරූපයක් ගන්නේය. සාහිත්‍යමය සන්නිවේදනයේදී පුද්ගලයාට වඩා වැදගත් වූයේ සමූහයයි. මෙහි සාහිත්‍ය සන්නිවේදනය පොදු වූ ද, සමමිතික වූ ද බහුමානීය වූ ද, සමතල වූ ද ස්වරූපයක් ගත් බව පෙනේ.

මේ අනුව ප්‍රාග් ලිඛිත සාහිත්‍යට ක්‍රියාකාරකම් සහ සාහිත්‍යට සන්නිවේදනය අන්‍යෝන්‍ය වශයෙන් සහ සම්බන්ධිතාව ක්‍රියාත්මක වූ අතර, එය වෙන් කර හඳුනාගැනීම උගහට විය. සාහිත්‍යමය ක්‍රියාකාරකම් සන්නිවේදනය වශයෙන් ද, සන්නිවේදන ක්‍රියාකාරකම් සාහිත්‍ය ක්‍රියාකාරකම් වශයෙන්ද ඉදිරිපත් වූ බව ප්‍රකට ය. මානව විෂය හැඩගැස්වීමෙහිලා මෙම අවධිය ඉතා තීරණාත්මක භූමිකාවක් ඉටු කර තිබේ.

මිනිසා වාචිකව අදහස් හා හැඟීම් හුවමාරු කර ගැනීම සන්නිවේදනය කර ගැනීම් ආරම්භ වූයේ දැනට වසර ලක්ෂයකට පමණ ඉහත දී බව මානව විද්‍යාඥයිගේ පොදු මතය වේ. නමුත් මානවයා ලිඛිතව අදහස් හා හැඟීම් හුවමාරු කර ගැනීම හෝ සන්නිවේදනය කිරීම දක්වා වර්ධනය වූයේ ඊට බොහෝ කාලයකට පසුව බව ඓතිහාසික සාධකවලින් පැහැදිලි වන්නේ ය. මිනිසා ලිඛිතව අදහස් හා හැඟීම් ප්‍රකාශ කරන්නට වූයේ මීට වසර 5000 ක පමණ කාලයක සිට බව පෙනේ. දැනට වසර 5000 ට පෙර මොහෙන්ජොදාරෝ - හරප්පා ශිෂ්ටාචාරයන්හි අක්ෂර ක්‍රමයක් තිබූ බවට සොයාගෙන තිබේ.

වර්තමානයේ මිනිසා භාවිත කරන ලිඛිත භාෂාව දක්වා විකාශය වූයේ ද දීර්ඝ කාලීන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.

ලේඛනය යනු කතාව සටහන් කිරීම සඳහා ආධාරක වන පද්ධතියකි. එය වාචික තොරතුරු සම්ප්‍රේක්ෂණය කිරීමේ ආකාරයකි. ලේඛන භාෂාව බිහිවීම මානව සංවර්ධනයේම ප්‍රතිඵලයකි. මානව වාචික සන්නිවේදනය ආවේණික වූ සීමා අතික්‍රමණය කිරීම ලේඛන මාධ්‍ය බිහිවීමේ එක් මූලික අවශ්‍යතාවක් බව අවබෝධකොට ගත යුතුය. එනම් වාචික තොරතුරු විශාල දුරප්‍රමාණයක් දක්වා ව්‍යාප්ත කරලීමත් ඒවා කාලය තුළ දීර්ඝ කාලයක් ආරක්ෂා කොට පවත්වා ගෙන යාමත් ලේඛනය බිහිවීමට තුඩුදුන් ඓතිහාසික කොන්දේසි වන්නේ ය.

ආරම්භයේ දී තොරතුරු සම්ප්‍රේෂණය කිරීම සඳහා මානවයා රූප ලේඛනය (Pictography) යොදා ගන්නා ලදී. මෙය එක්තරා ආකාරයක චිත්‍ර ලේඛනයකි. මෙය ලේඛන කලාවේ වර්ධනයේ එක් ඓතිහාසික අවධියකි. මෙහි විශේෂත්වය වන්නේ පණිවිඩයේ හරය සන්දර්භය චිත්‍රයක් රූපයක් ස්වරූපයෙන් නිර්මාණය කිරීම හෝ රූප පෙළක ආකාරයට ක්‍රමානුකූලව නිරූපණය කිරීමයි. මෙහි දී සිදුවූයේ රූප මගින් අදහස් හා හැඟීම් ප්‍රකාශ කිරීමයි. බොහෝ විට රූපාක්ෂර මගින් අදහස් ප්‍රකාශ කිරීම රතු ඉන්දියානුවරුන් අතර මෙන්ම අප්‍රිකානු ජනයා අතර පුළුල් ලෙස ව්‍යාප්තව පැවතිණි. මෙම රූපාක්ෂර භාවිතය පිළිබඳව ඓතිහාසික සාධක ප්‍රංශයේ ලැස්කෝ ගුහා සිතුවම් තුළින් සහ ස්පාඤ්ඤයේ අල්ටමීරා ගුහා සිතුවම් තුළින් ද සොයාගෙන තිබේ.

සමකාලීන ලේඛන කලාවේ වර්ධනයේ මීළඟ අවධිය වූයේ චින්තනාක්ෂර (Ideography) මෙහි දී දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වන්නේ යම් අර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා සංකේත යොදා ගැනීමයි. නිර්දර්ශනයක් වශයෙන් ඊ තලය සංකේතය මගින් යුධ ප්‍රකාශ කිරීම හිරු මගින් දවස දැක්වීම ආදිය දැක්විය හැකි ය. මෙය රූපාක්ෂර ක්‍රමයේ සංවර්ධිත අවස්ථාවක් වශයෙන් හැඳින්විය හැකි ය. පැරණි ඊජිප්තු හා චීන ජාතිකයින් මෙන්ම මායාවරුන් ද මෙම චිත්තක්ෂර ක්‍රමය පෘථුලව භාවිත කොට ඇත.



මෙම රූපාක්ෂර ක්‍රමයේ ඉදිරි වර්ධනයේ තර්කානුකූල ප්‍රතිඵලය වූයේ වචනාක්ෂර (Logography) ක්‍රමය බිහි වීමයි. මෙය සමස්ත වචනයක්ම අදහස් වන්නා වූ සංකේතයකි. මෙහි දී යම් සංකේතයක් මගින් එක් නිශ්චිත වචනයක් නිරූපණය වීමයි. මේ තත්ත්වය තව දුරටත් වර්ධනය වීම තුළින් ලේඛන කලාව බිහි වූ බව පෙන්වා දිය යුතු ය. මූලික වශයෙන් සබඳතා පදනම් කරගත් එනම් ශබ්දාශ්‍රිත අක්ෂර බිහි වීමත් සමග මානවයාගේ අත්දැකීම්, හැඟීම්, අදහස් ආදිය සටහන් කර තැබීමේ ප්‍රයත්නය සිය පරිසමාප්තිය කරා ළඟා විය. මේ අනුව අද්‍යතන මානව භාෂාව යනු උසස් මට්ටමකට වර්ධනය වූ සංඥා පද්ධතියකි. මෙය මිනිස් චින්තනයේ හා භාෂණයේ පදනම අතර, එය කාලයක් ආරක්ෂිතව තබා ගැනීම සඳහාත් ලිඛිත සන්නිවේදන ස්වරූපය බිහි වූ බව පෙනේ.

ඓතිහාසික තොරතුරුවලට අනුව පෙනී යන්නේ ලිඛිත සන්නිවේදනය බිහි වීමට සමාජ ආර්ථික සාධක තුඩු දුන් බවයි. මානව ඉතිහාසයේ පන්ති සමාජය බිහිවීමත් සමගම ලිඛිත සන්නිවේදන ස්වරූපය වර්ධනය විය. සංකීර්ණ සමාජ, ආර්ථික, සංස්කෘතික හා ආධ්‍යාත්මික ගතිකය නිශ්චිතව හා නිවැරදිව සටහන් කර තැබීමේ කාලීන අවශ්‍යතාවක් වූ බැවින් එම ක්‍රියාකාරම් සමග මෙම නව සන්නිවේදන ස්වරූපය බිහි වූ බව අවධාරණය කළ යුතු ය.

ලේඛන කලාව ලිඛිත සන්නිවේදන ස්වරූපය මානවයා තුළ නිලීනව තිබූ නිර්මාණාත්මක ශක්‍යතා විකසිත වීමට අවශ්‍යමාවතක් සකස් කළේ ය. මානව චින්තනය සහ භාෂාව අතිශයින්ම සන්නිවේදනාත්මක පමණක් නොව ඒවා නිර්මාණාත්මක ය. එය නිර්මාණය වීමේ ක්‍රියාවලියට සාහිත්‍යමය සන්නිවේදනය සැලකිය යුතු බලපෑමක් සිදුකර ඇත.

මානව අත්දැකීම් අදහස් හැඟීම්, සිතිවිලි විවිධ භාෂාත්මක ස්වරූප ශෛලීන් මගින් නිර්මාණාත්මකව ප්‍රකාශ කළ හැකි ය. විවිධ භාෂාවන් තුළ ඊටම ආවේණික වූ අනන්‍යතාවක් පමණක් නොව නිර්මාණාත්මක ශක්‍යතාවක් පවතින බව වටහා ගත යුතු වේ.

ලිඛිත සන්නිවේදනයේ දී ලියන දේ මෙන්ම එය ලියන ආකාරය ද ඉතා වැදගත් වේ. එනම් අන්තර්ගතය මෙන්ම එහි ආකෘතිය ද වැදගත් ය. ලිඛිත සන්නිවේදනයේ දී ශෛලිය ඉතා

වැදගත් වන්නේ ය. යමෙක් කෙසේ හෝ සරල ශෛලිය භාවිත කරමින් ලිවිය හැකි ය. විශේෂයෙන් ම ජනමාධ්‍ය සඳහා ලියන විට දී අදාළ මාධ්‍යට සුදුසු ශෛලියක් තෝරා ගැනීම අවශ්‍ය වන්නේ ය, නිදර්ශනයක් වශයෙන් ගුවන්විදුලි මාධ්‍ය සඳහා ලිවීමට වඩා පුවත්පත් මාධ්‍යය සඳහා  ලිවීමේ දී ලේඛන ශෛලිය වෙනස් විය යුතු ය. ගුවන් විදුලිය සඳහා සරල කෙටි ශෛලියක් වැදගත් වන අතර, පුවත්පත් මාධ්‍ය සඳහා ගැඹුරු අදහස් ප්‍රකාශ කිරීම සඳහා ඊට වඩා සංකීර්ණ හෝ ව්‍යක්ත ශෛලියක් යොදාගත හැකි ය. එසේම කවියක් ගීතයක් ආදිය ලියන විට දී අනුප්‍රාස ශෛලියත්, භාව ශෛලියත් තොරාගැනීම ඵලදායික වන්නේ ය. මේ අනුව විවිධ මාධ්‍යයන්ට (ජනමාධ්‍ය, පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය, සිනමාව, සාහිත්‍ය, සමාජීය ගීතය, කවිය, නිසඳැස, කෙටි කතා, නවකතා) උචිත ලේඛන ශෛලියේ පවතින බව තේරුම් ගත යුතු වේ.  එසේම ඒවාට අදාළ සන්නිවේදන ශෛලින් ද පවතී. ඒ සෑම සාහිත්‍ය අංගයක්ම නිශ්චිත සන්නිවේදන මාදිලියකි. විධික්‍රමයකි.

සෑම භාෂාවකටම එයට අනුරූප වූ ලේඛන සම්ප්‍රදායක් පවතී. එකී ලේඛන සම්ප්‍රදාය ප්‍රගුණ කිරීම හා එය ගැඹුරින් වටහා ගැනීම ඵලදායි ලේඛනයක නියුක්ත වන්නන් හට අවශ්‍ය කොන්දේසියකි. එය සාහිත්‍ය සන්නිවේදනය සඳහා ද අතිශය වැදගත් කොන්දේසියකි. සමාජීය හා පුද්ගලික අත්දැකීම් අදහස් හැඟීම් අදාළ කණ්ඩායම්වලට අවබෝධ වන ආකාරයට ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ ය. අවස්ථාවට සුදුසු වචන යොදා ගනිමින් ලේඛනය සාරවත්ව හා ආකර්ෂණීයව ගොඩනගා ගැනීමේ භාෂාවක් එම ලේඛකයාට තිබිය යුතු ය.

භාෂාව කුමන ස්වරූපයෙන් පැවැතියත් ඊට අදාළ ව්‍යාකරණයක් පවතී. භාෂාවක් මෙන්ම එහි ව්‍යාකරණය ද සැමදා එක තැන එක ආකාරයට නොපවතී. එය ඉතා ගතික වූවකි. සමාජ ආර්ථික සංස්කෘතික පාරිසරික වෙනස් වීම් සමග භාෂාව ද එහි ප්‍රකාශන ශෛලීන් ද විපර්යාසයට ලක්වීම වැළැක්විය නොහැකි ය. භාෂාවක ශක්තිය ප්‍රකාශයට පත් වන්නේ එහි ව්‍යාකරණ පද්ධතිය තුළ නොවේ. එමගින් පළ කරනු ලබන බුද්ධිමය හා භාවමය උපයෝගීතාව මත ය. විශේෂයෙන්ම පාඨකයාගේ සිත ආකර්ෂණය වන්නේ පඨය



අඩංගු බුද්ධිමය හා භාවමය තත්ත්වයන්ට මිස එහි ව්‍යාකරණ රටාවට නොවේ. මේ නිසා සාහිත්‍ය සන්නිවේදනයේ දී අන්තර්ගතයට වඩා ආකෘතිය වැදගත් වන බව ඓතිහාසික ලක්ෂණයකි.

ලෝකයේ ඕනෑම භාෂාවක් ලිඛිත හා කථික භාෂාව යනුවෙන් කොටස දෙකකට බෙදිය හැකි ය. මේ අනුව එකම භාෂාවේ ලිඛිත හා ලේඛන වශයෙන් භාවිත දෙකකි. සිංහල භාෂාව ගත්ත ද එහි ලිඛිත හා කථික ප්‍රභේද දෙකකි. එම ප්‍රභේද දෙකට ඊටම ආවේණික ව්‍යාකරණයක් පවතී.

ලේඛන පරිචයක් ඇති කර ගැනීම සඳහා ලේඛකයා පොත පත කියවිය යුතු ය. විවිධ මාදිලියේ අත්දැකීම් ලැබිය යුතු ය. ලේඛකයාගේ ලිවීම ගලා එන්නේ සිය මනසින්ම නොවේ. ඊට අවශ්‍ය අමුද්‍රව්‍ය ලේඛකයාට ලැබෙන්නේ සමාජයෙනි. එනම් ලේඛකයා ලිවීමට පදනම් වන තොරතුරු දත්ත සාධක අත්දැකීම් අනුභූතීන් ලබා ගන්නේ සමාජය සමග සිදුවන අන්තර් ක්‍රියාවන් මගිනි. එනම් ලේඛකයා සමාජය සමඟ යෙදෙන සන්නිවේදනය මගිනි. ලේඛකයාගේ සිතින් මනසින් සිදු කෙරෙන්නේ එම අමුද්‍රව්‍ය විවිධාකාරයට සම්බන්ධීකරණය කොට නව මනසකින්, නව දැක්මකින් සමස්තය නියෝජනය වන්නා වූ විශේෂ අදහසක් ජනිත වන ආකාරයට ඉදිරිපත් කිරීමයි.

ලෝකයේ ප්‍රකට ලේඛකයින්ගේ චරිතාපදාන කියන විට අපට පෙනි යන එක් පොදු කරුණක් වන්නේ ඉහළ ලේඛන පරිචයක් ඇති කර ගැනීම නම් භාෂා හා ලේඛනය ලේඛන ඉතිහාසය ගැඹුරින් හැදෑරිය යුතු බවයි. සාහිත්‍යමය පොත පත පරිශීලනය කිරීම තුළින් ලේඛකයාට දැනුම ඥානය පමණක් නොව අත්දැකීම් ද අත්කර දෙන්නේ ය. එසේම ඉහළ ලේඛන පරිචයක් ඇතිකර ගැනීම සඳහා සමාජ සිද්ධීන් හා ක්‍රියාවලීන් පිළිබඳව දැඩි විමසිලිමත් භාවයකින් සහ සංවේදීභාවයකින් පසු විය යුතු ය. භාෂාව හා ලේඛකයා සමාජීය ක්‍රියාවලීන්ගෙන් වෙන් කළ නොහැකි ය. සමාජීය අත්දැකීම් හා විපර්යාසයන් සමග ලේඛකයාගේ වාක්කෝෂය මෙන්ම චින්තනය ද වර්ධනය වන්නේ ය. එය සෘජු ලෙසම ලේඛන පරිචය වර්ධනය වීම කෙරෙහි බලපාන්නේ ය. ලේඛන පරිචය වර්ධනය කර ගැනීම සඳහා ලිවීම පමණක් නොව කියවීම ද අතිශයින්ම වැදගත් බව පැහැදිලි ය.

එසේම ලේඛන පරිචය වර්ධනය වීම සඳහා සිදුවීම් හා ක්‍රියාවලීන් නිරීක්ෂණය කිරීම පමණක් නොව ඒවාට සක්‍රීයව සහභාගීවීම ද ඉතා වැදගත් බව ඓතිහාසික සාධක පෙන්වා දේ.

සාහිත්‍ය සන්නිවේදනය පොත් ආදී සාහිත්‍ය පඨිත මගින් මිනිසාට ලබාවන අතර ඒ තුළින් මිනිසුන් අතර බුද්ධිමය, මානවවාදීය ස්වරූපය සහ ජීවන ශක්‍යතාව වර්ධනය වන්නේ ය. සාහිත්‍ය සන්නිවේදනය පුළුල් පරිපථයක් තුළ විමර්ශනය කිරීමේදී එය ජාතිකවාදීය සහ මානවවාදී පරමාදර්ශ, අදහස් ප්‍රවර්ධනය කරමින් සුන්දරත්වය සහ චමත්කාරය පතුරවමින් මිනිසුන් එකට ඒකාබද්ධ කිරීමට කටයුතු කරන්නේය. එක් ආතතින් කර්තෘයිය පාඨකයින් සමග ද, පාඨකයින් ඔවුනොවුන් අතර ද සබඳතා වර්ධනය වීමට ද ඉවහල් වන අතර, අනෙක් අතින් සාහිත්‍යයික ක්ෂේත්‍රයෙහි සමස්ත ව්‍යුහීය සංරචකයන් අතර ද සබඳතා වර්ධනය වීමට ද පාදක වන්නේ ය.

සාහිත්‍ය සන්නිවේදන සංකල්පය තවත් පුළුල්ව සහ විස්තරාත්මක ඉදිරිපත් කරන්නේ නම් එය මූලික සංරචක පහකින් සමන්විතව ක්‍රියාත්මක වේ. පාඨකයා, කර්තෘ, නිර්මාණය, සාහිත්‍ය අවකාශය සහ සාහිත්‍ය සන්නිවේදනය මෙයට ඇතුලත් වේ. මේ අනුව පාඨකයාත්, ලේඛකයාත්, නිර්මාණයත් සාහිත්‍යක අවකාශයත් පාදක කරගෙන ගොඩනැගෙන සහ ඒවා අතර පවතින සම්බන්ධතාව සාහිත්යික සන්නිවේදනයට මූල් වන බව පෙනේ. සාහිත්‍ය සන්නිවේදනයේ නියම ස්වභාවය අවබෝධ කර ගැනීම සඳහා මේ එක් එක් සංරචකය වෙන වෙනම වටහා ගැනීමට වඩා මේවා අතර ගොඩනැගෙන අන්තර් සම්බන්ධතා පද්ධතිය අවබෝධ කරගත යුතු වේ. මේ අනුව සාහිත්‍ය සන්නිවේදනය යනු ලේඛකයන්, පාඨකයන්, කෘතියන්, සාහිත්‍ය අවකාශයන් අතර ගොඩනැගෙන අන්තර්ක්‍රියාකාරී පද්ධතියකි.

භාෂාවේ සන්නිවේදනාත්මක පැතිකඩ ඉතා වැදගත් වන අතර සාහිත්‍ය අධ්‍යයනයන්ගේ සන්නිවේදනාත්මක පැතිකඩ වාග්විද්‍යා අධ්‍යයනයේ ඉතා වැදගත් අංශයකි. විශේෂයෙන් සාහිත්‍ය අධ්‍යයනයන්ගේ මානව කේන්ද්‍රීය ස්වභාවය සන්නිවේදනාත්මක ප්‍රවේශයක් අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ ය.



සාහිත්‍ය සන්නිවේදනය පමණක් නොව ඕනෑම සන්නිවේදනයකට ආවශ්‍යක සාධකය වන්නේ තොරතුරු ය. අප සහ අපගේ හැඟීම් බාහිර ලෝකයාට අනුවර්තනය වීමේ ක්‍රියාවලියේ දී අර්ථවත් වන්නා වූ සන්දර්භය තොරතුරු ලෙස හැඳින්වි හැකි ය. තොරතුරු මානව ක්‍රියාකාරකම් නියාමනය සහ ප්‍රජානනය සමග සම්බන්ධ වේ. එය පද්ධතියක් ලෙස මානව සමාජයේ ස්ථාවරය සහ ගතික සමතුලිතභාවය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වේ. පොදු තොරතුරු න්‍යාය තුළ දී යම් පද්ධතියක තොරතුරුවල ක්‍රියාකාරිත්වට වඩා සාහිත්‍ය ක්ෂේත්‍රය තුළ දී තොරතුරුවල ක්‍රියාකාරිත්වයේ න්‍යායික විශේෂතා දැකිය හැකි ය. නිදර්ශනයක් වශයෙන් විද්‍යාත්මක, බුද්ධිමය පරිගණනයක් තුළ කාලානුරූපව තොරතුරුවල අධිකතරභාවයන් ප්‍රදර්ශනය කරන අතර, නමුත් සාහිත්‍ය සන්නිවේදනයේ තොරතුරුවල අධිකතරභාවය පිළිබඳ ප්‍රශ්නය ප්‍රබලව මතු නොවේ. සැබෑ කලා කෘතිවල තොරතුරුවල අධිකතරභාවය නිසා ඇතිවන එහි වටිනාකම, අගය අඩුවීම සිදු නොවේ. එනම් අප කලා නිර්මාණ මගින් ලබන සෞන්දර්යාත්මක සංතෘප්තිකරභාවය හීන නොවන්නේ ය. මෙහි දී සාහිත්‍ය නිර්මාණයේ අවිනිශ්චය වී ඇති බව පැහැදිලි වේ. එනම් සෙසු සන්නිවේදන ප්‍රභේදවලට වඩා සාහිත්‍ය සන්නිවේදනයේ දී සන්දර්භය අභිබවා එහි ස්වරූපය මතුවන බව ප්‍රකට ය. සාහිත්‍ය නිර්මාණයේ අන්තර්ගතය ග්‍රහණය කර ගැනීමේ දී එය අනාවරණය කරගැනීමේ දී එහි ස්වරූපය හෝ අකෘතිය තීරණාත්මක භූමිකාවක් ඉටු කරනු ලැබේ.

සාහිත්‍ය සන්නිවේදනයේ විශේෂ ලක්ෂණයක් වන්නේ එහි වටිනාකම තීරණය වන්නේ නව්‍යත්වය සහ අනපේක්ෂිතත්වය මත නොව ඊට ප්‍රතිලෝමව සාමාන්‍ය තෙරතුරුවල ගුණාංග එයට කොපමණ ප්‍රමාණයකින් සහ ආකාරයකින් බාධා කරන්නේ ද යන කාරණය මත ය. එනම් සාහිත්‍ය නිර්මාණය ගැඹුරු මානව සහානුභූතිය, සහනුකම්පනීය හැඟීම් මන්දගාමීත්වය ඇති කිරීමට සමත් වන්නේ ද යන්න ය.

මේ අනුව කලාත්මක සාහිත්‍යයික සන්නිවේදනයේ දී සාහිත්‍ය භාෂාවේ ශෛලිය සෞන්දර්යාත්මක ප්‍රජානනමය කාර්යයක් ඉටු කරනු ලැබේ. එහි දී සියලු ම අදහස් ස්වරූපයෙන් පළ වන අතර

ඒ නිසාම එහි දී තොරතුරුවල අධිකතරභාවයට ඉඩක් නොමැත. යම් හෙයකින් එහි තොරතුරුවල අධිකතරභාවය ප්‍රදර්ශනය වුවහොත් එය සෞන්දර්යාත්මක සංදේශය සංජානනයට බාධාවක් විය හැකි ය. මේ අනුව අධිකතරභාවය සාමාන්‍ය සන්නිවේදනයෙහි සංදේශයක ආවශ්‍යක සංයෝජිත උපාංගයක් ලෙස ඉදිරිපත් වූවක්, සාහිත්‍ය සන්නිවේදනයේ දී එය යම් අවහිරයක් බවට ද පත් විය හැකි ය.

තොරතුරු වඩාත්ම පොදු විද්‍යාත්මක සංකල්පයක් වශයෙන් එය විවිධ ක්‍රියාවලීන්ගේ බහුවිධත්වය අධ්‍යයනය කිරීම සඳහා භාවිත කළ හැකි ය. ඒ නිසාම අධ්‍යයන කරනු ලබන ක්ෂේත්‍රයට අදාළව එහි විවිධ වෙනස්කම් දැකිය හැකි ය. සමහරෙක් එය නව අදහස් ලබාගන්නා සහ ක්‍රියාවලීන්ගේ ප්‍රලීය තත්වයන් ඉවත් කිරීමේ මාධ්‍යයක් ලෙස විග්‍රහ කරති. පතවල සංකීර්ණ ස්වභාවය මීට වඩා වෙනත් මාන ඔස්සේ නිර්ණය විය හැකි බව තවත් සමහර අය පෙන්වා දෙති. විවිධත්වය සම්ප්‍රේෂණය කිරීම, ව්‍යුහවල සංකීර්ණභාවයේ පරිමාණය, වාරණයේ සම්භාවිතාව ඒ අතර වේ. එසේම ලේඛකයා හා පාඨකයා අතර සම්බන්ධතාව මෙයට වඩා අතිරේක විකල්පීය අවස්ථා නිර්මාණය කරන බව ප්‍රකාශ කළ යුතු ය. නිදර්ශනයක් වශයෙන් යම් සාහිත්‍ය නිර්මාණයක් ලේඛකයාගේ සිට පාඨකයා දක්වා පරිවර්තනය වීමේ දී එහි අවිනිශ්චිතභාවය වර්ධනය වන අතරම එහි ප්‍රතිඵලයක් ලෙස සාහිත්‍ය පතයේ තොරතුරුමය අන්තර්ගතය වර්ධනය වන්නේ ය.

උපයෝග්‍යතාවයේ දී දෘෂ්ටිකෝණයට අනුව පඨයක අඩංගු තොරතුරු අන්තර්ගතය තුළ සැලසුම්කරණය ලද සංදේශයක් තිබේ. එවැනි පඨවල තොරතුරු වර්ග තුනක් නිරීක්ෂණය තුළ හැකි ය. සන්දර්භමය සිද්ධි වාචික, සන්දර්භමය - සංකල්පීය සහ සන්දර්භමය - උප පඨමය තොරතුරු වශයෙනි. සන්දර්භමය - සිද්ධිවාචික තොරතුරු නිර්මාණයේ පූර්ව සැලැස්ම හා සම්බන්ධ තොරතුරු වන අතර, එය වාචිකව සාධක, සිද්ධි, ක්‍රියාවලීන් පිළිබඳව තොරතුරු වේ. එය යථාර්ථවා දී හෝ පරිකල්පනීය හෝ විය හැකි ය. එනම් එය සත්තමය ගතිලක්ෂණවලින් යුත් තොරතුරු වන්නේ ය. මෙම තොරතුර තනි තනි වචන මගින් හෝ ලබාගන්නා තොරතුරු වේ. මෙම තොරතුරු සමස්ත පඨය පුරාම පැතිර පවතින අතර,



සන්දර්භමය - සංකල්පීය තොරතුරුවල සංකීර්ණතාව සහ ගැඹුරින් අනාවරණය කර ගැනීම සඳහා රුකුලක් සපයන්නේ ය. සන්දර්භමය - සංකල්පීය තොරතුරු පඨයෙහි ඉතාම වැදගත් තොරතුරු ප්‍රභේදයක් වන අතර, එය සන්දර්භමය - සිද්ධිවාචික තොරතුරු මගින් කර්තෘගේ පුද්ගලික සංකල්පය හා අවබෝධයන් විස්තර කෙරේ. එය කර්තෘගේ අදහස් සහ ඔහුගේ සන්දර්භීය අර්ථකථනය ලෙස සැලකිය හැකි ය. සාහිත්‍ය නිර්මාණයක් තුළ සන්දර්භයට සංකල්පීය තොරතුරු සෞන්දර්යාත්මක - කලාත්මක ගතිලක්ෂණ ගන්නා අතර, එය විකේතනය කර ගැනීම සඳහා විවරණාත්මක ප්‍රයත්නයක් අවශ්‍ය වේ. තුන්වන තොරතුරු ප්‍රභේදය වන සන්දර්භමය - උප පඨමය තොරතුරු සාහිත්‍ය නිර්මාණය තුළ සැඟව තිබෙන්නේ ය. එය වාචිකව ප්‍රකාශ මාන නොවන අතර,එම තොරතුරු වර්ගය නිර්මාණය තුළ සැමදාකම පවතින්නේ නැත. එය පතය තුළ ඇති සන්දර්භමය සිද්ධිවාචික තොරතුරු තුළින් මතු කොට ගත යුතු වේ. නමුත් එය මතුකර ගැනීම බොහෝ දුරට රඳාපවතින්නේ පාඨකයාගේ හැකියාව මතය. පාඨකයාගේ සක්‍රීය කියවීම මතය. සාහිත්‍ය නිර්මාණයත්, පාඨකයාත් අතර සිදු වන අන්තර්සම්බන්ධතාව අර්ථ සහ රස සම්පාදනයෙහිලා විශාල වැදගත්කමක් දරන බව වර්තමාන අදහසයි. මෙය එක්තරා අකාරයකට සාම්ප්‍රදායික සාහිත්‍ය නිර්මාණයක කර්තෘ කේන්ද්‍රීය අර්ථාධිපත්‍යයෙහි සිට පාඨක කේන්ද්‍රය අර්ථ සම්පාදන රටාවකට ප්‍රවිෂ්ට වීමක් ලෙස සැලකිය හැකි ය. මේ තත්ත්වය නිසා සාහිත්‍ය සන්නිවේදන ක්‍රියාවලිය ඒකාර්ථික ස්වරූපයේ සිට අර්ථ බහුල්‍ය රටාව ගමන් කරන්නේ ය. සාහිත්‍ය සන්නිවේදන ක්‍රියාවලිය තුළ නිලීන අතිප්‍රබල ශක්‍යතාවකින් සමන්විත වන සංඥාර්ථවේ දී ය. ව්‍යුහයන්ගේ වැඩිවීම පාඨකයන් තුළ අර්ථබාහුල්‍ය ප්‍රවණතාව වර්ධනය කරන්නේ ය.

සාහිත්‍ය පඨයක් බිහි වීම යනු භාෂාව පාදක කරගෙන ලෝකය පිළිබඳ තමන්ගේම පින්තූරයක් නිර්මාණය කිරීමේ ප්‍රයත්නයක් පමණක් නොව වෙනස් වන ලෝකය පිළිබඳ ව සිය ආකල්පය වෙනත් අය වෙත රැගෙන යැමක් ද එතුළ තිබේ. මෙහි වෙනත් අය යන්නෙන් අදහස් වන්නේ ලේඛකයාගේ සමගාමී පාඨක පිරිසය. මෙය සරල පාඨක පිරිසක් නොව සාහිත්‍ය නිර්මාණයේ

අනාගත 'ජීවිතය' පවත්වා ගෙන යන්නේ ය. එය පාඨකයාගේ යම් ක්‍රියා ආකෘතියක් පිළිබඳ අදහසක් බව එක්කෝ සඳහන් කරයි. සාහිත්‍ය නිර්මාණය සැමටම පොදු අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා පාදක වන්නකි.

මේ අනුව සාහිත්‍ය සන්නිවේදනය මානව සන්නිවේදන ස්වරූප අතර සුවිශේෂී ස්වරූපයක් ලෙස හඳුනාගත හැකි අතර, එය මානව විෂය හැඩගැස්වීමෙහිලා සෞන්දර්යාත්මක භාවවිෂයික, සංවේද්‍ය පරිකල්පනීය සහ මානවවා දී භූමිකාවක් ඉටු කරන බව පැහැදිලි වේ. මේ අනුව සාහිත්‍ය සන්නිවේදනය යථාර්ථය පරාවර්තනය කිරීමේ හුදු මාධ්‍යයකට වඩා එය ප්‍රතිනිර්මාණය කිරීමේ සහ මානව විෂය නිර්මිත කිරීමේ ප්‍රබල සාධකයකි.

## පාදක සටහන්


1. Cook. M (1997) *Language and Reason: A Study of Hobermas' Pragmatics*, Cambridge MA: MIT Press.
2. Eagleton, Terry (1996) *Literary Theory: An Introduction -Minneapalis*: University of Minnesota press.
3. Grehan, K (2002) Gramsci Culture and Anthropology London: Pluto.
4. Held. D (1980) *Introdution to critical Theory Horkheimer to Habermas*, Combridige: polity.
5. Marx. K and Engelo, F (1970) *The German Ideology*, London Laurence and Wishart.
6. Kristeva. J (1980) *Desire in Language*, New York Columbia University Press.
7. Lenin V.I (1973) *What is to be done?* London. Progress.
8. Nick Crossley (2005) *Key Concepts in Critical Social Theory*, sage, London.
9. Wilfred L. Guerin, Earle Labor. Lee Morgan, Jeanne C. Reesman, Jhon R. Willingham (2005) *A Handbook of Critical Approaches to Literature*:Oxford University Press
10. Robin Mayhead, *Understanding Literature*- Cambridge University
11. V. A Lektorsty, *Subject, Object Cognition*, Moscow 1984
12. Spirkin, *Fundamental of Philosophy*, Moscow 1990
13. Vassily Novikov, *Artistic Truth Dialectics of Creative Work*, Moscoe 1981
14. A. C Grayling(ed) Philosophy 2. *A guide Through the Subject*, London-1998
15. Whorf B. *Language Thought and Reality*, London-1956